**DP/G5/2024/2**

මගේ අංකය : 6/5/ශිෂ්‍යත්ව/2024
පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල.
2024 අගෝස්තු මස 15 දින

සියලුම විදුහල්පතිවරුන්,

## පාසල්වලට සිසුන් තෝරා ගැනීමට හා ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට 5 ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය - 2024

උක්ත විභාගය සඳහා ඔබ පාසල මගින් අයදුම්කරන ලද විභාග අපේක්ෂකයන්ගේ නම, විභාග අංකය සහ විභාග මධ්‍යස්ථානය සඳහන් පැමිණීමේ ලේඛනයේ පිටපතක් මේ සමඟ එවා ඇත. විභාග අපේක්ෂකයන්ගේ නම්, ඔවුන්ගේ උප්පැන්න සහතිකය සමග නැවත වරක් ඉතා සුපරීක්ෂාකාරීව සසඳා බලා නිරවද්‍යතාවය තහවුරු කර ගත යුතුය.

02. විභාග අයදුම්කරුවන්ගේ පැමිණීමේ ලේඛනය විභාග ප්‍රවේශ පත්‍ර ලේඛනය වශයෙන් යොදා ගත යුතුය.

03. **අයදුම්කරුවන්ගේ පැමිණීමේ ලේඛනය**

i. ඔබ විසින් මාර්ගගත ක්‍රමයට (online) අපගේ දත්ත පද්ධතියට ඇතුළත් කරන ලද කිසියම් අයදුම්කරුවකුගේ නමක් ඔබ වෙත එවා ඇති පැමිණීමේ ලේඛනයේ ඇතුලත් නොවේ නම් ඒ බව විභාග දෙපාර්තමේන්තුවේ පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාවේ විභාග කොමසාරිස් වෙත වහාම දැනුම් දිය යුතුය.

ii. අන්ධ අයදුම්කරුවන් වෙතොත් ඔවුන්ට පහසුකම් සැලසීම සඳහා ද පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාවේ විභාග කොමසාරිස් වෙත වහාම දැනුම් දිය යුතුය.

iii. www.doenets.lk හෝ http://onlineexams.gov.lk/eic වෙත පිවිසීමෙන් පැමිණීමේ ලේඛනය බාගත කර ගැනීමේ (Download) පහසුකම් සලසා ඇත.

iv. මොනම හේතුවක් නිසාවත් ඔබ වෙත එවා ඇති පැමිණීමේ ලේඛනය ආපසු එවිය යුතු නොවේ.

v. විභාග අයදුම්කරුවන් සම්බන්ධ යම්කිසි ඉල්ලීමක් කරන්නේ නම්, විදුහල්පති විසින් ම කළ යුතුය. පෞද්ගලිකව කරනු ලබන කිසිදු ඉල්ලීමක් සලකා බලනු නොලැබේ.

04. එක සමාන නම් ඇති දරුවන් ඔබ පාසලේ සිටී නම්, ඔවුන් වෙත විභාග අංකය ලබා දීමට පෙර එම අයදුම්කරුවන්ගේ සම්පූර්ණ නම පාසල් පිටපත සමඟ ද සසඳා බලා නියමිත අයදුම්කරුට හිමි විභාග අංකය ඔහුට/ඇයට නොපමාව ලබා දී එසේ කළ බවට ලොග් සටහනක් තබන්න.

05. **සංශෝධන**

i. පැමිණීමේ ලේඛනයේ සඳහන් අයදුම්කරුවන්ගේ පහත තොරතුරු සංශෝධනය කළ යුතු නම්, එය www.doenets.lk හෝ http://onlineexams.gov.lk/eic වෙත පිවිසීමෙන් මාර්ගගතව (Online) සිදු කළ යුතු ය. 2024 සැප්තැම්බර් 02 වන දින සිට 2024 සැප්තැම්බර් 08 වන දින දක්වා ඒ සඳහා පහසුකම් සලසා ඇත.

- නම
- ස්ත්‍රී/පුරුෂ භාවය
- උපන්දිනය
- ආදායම් තත්ත්වය

ii. **පැමිණීමේ ලේඛනය සමඟ අයදුම්කරුවන්ගේ ආදායම් තත්ත්වයේ නිවැරදිභාවය තහවුරු කර ගත යුතුය. සංශෝධන වෙතොත් වහාම විදුහල්පති විසින් මාර්ගගතව එකී සංශෝධන සිදු කළ යුතුය. මෙය විදුහල්පතිගේ පූර්ණ වගකීමක් වන අතර පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් පිළිබඳව සලකා බලනු නොලබන බැවින් එහි වගකීම විදුහල්පති විසින් පෞද්ගලිකව භාරගත යුතුය. මේ පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීම අනිවාර්ය වේ.**

**06. පහත සඳහන් කරුණු පිළිබඳව සැළකිලිමත්ව කටයුතු කළ යුතුය.**

i. පැමිණීමේ ලේඛනයේ සඳහන් විභාග අංකය අයදුම්කරුවන්ට වෙන වෙනම ලියා දී එය තමන්ගේ විභාග අංකය බවත්, උත්තර පත්‍රවල නියමිත ස්ථානයේ නිවැරදිව සඳහන් කරන ලෙසත් උපදෙස් ලබාදීම කළ යුතුය.

ii. අයදුම්කරුවන්ගේ විභාග අංක තරමක් ලොකුවට මුද්‍රණය කර හෝ ලියා ඔවුන්ගේ කමිස සාක්කුවේ හෝ ගවුමේ පැහැදිලිව පෙනෙන පරිදි පළඳවන්න. මේ පිළිබඳව දෙමාපියන් දැනුවත් කළ යුතුය.

iii. පැමිණීමේ ලේඛනයේ අයදුම්කරුවන්ගේ නම් ඉදිරියෙන් අත්සන ලබා ගැනීම සඳහා වෙන් කර ඇති තීරුවේ අයදුම්කරුගේ අත්සන ලබා ගන්න. මීට අමතරව විභාගය පවත්වන අවස්ථාවේ දී ශාලාධිපති වෙත ලබා දී ඇති පැමිණීමේ ලේඛනයේ ද ඔවුන් අත්සන් කළ යුතු බවත්, ඒ සඳහා විභාග මධ්‍යස්ථානයට පැය භාගයකට කලින් යා යුතු බවත්, අයදුම්කරුවන් කැටුව යන ගුරු භවතාට දැනුම් දෙන්න. මේ සම්බන්ධ සියලු උපදෙස් විභාග අයදුම්කරුවන්ට ද ලබා දිය යුතුය.

iv. විභාග දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොමැතිව පැමිණීමේ ලේඛනයේ කිසිදු සංශෝධනයක් සිදු නොකළ යුතු අතර, විභාග දෙපාර්තමේන්තුව විසින් විමසූ විට ඉදිරිපත් කිරීම සඳහා පැමිණීමේ ලේඛනය සුරක්ෂිතව තබා ගත යුතුය.

v. තමන්ගේ විභාග අංකය, විභාගය පැවැත් වූ වර්ෂය සහ විභාග මධ්‍යස්ථානය සටහන් කර ගැනීමට අයදුම්කරුවන්ට/දෙමව්පියන්ට උපදෙස් දෙන්න.

**07. අනන්‍යතාව**

ඉහත 6. iii ඡේදයේ සඳහන් පරිදි අත්සන ලබා ගත් පැමිණීමේ ලේඛනය විභාග දින ශාලාවට රැගෙන ගොස් ඒ අනුව ශාලාධිපති වෙත අනන්‍යතාව තහවුරු කර ඔවුන් නියමිත ස්ථානවල අසුන් ගන්වන ලෙස අයදුම්කරුවන් කැටුව යන ගුරුභවතාට/ගුරුභවතුන්ට උපදෙස් ලබා දෙන්න.

08. විභාග අයදුම්කරුවන් තම පාසලේ විභාග මධ්‍යස්ථානයක් නොමැතිව වෙනත් පාසලක පිහිට වූ විභාග මධ්‍යස්ථාන වෙත රැගෙන යාම සහ ආපසු රැගෙන ඒම සඳහා අයදුම්කරුවන් 40ට හෝ ඊට අඩුනම් එක් ගුරු භවතෙක් ද අයදුම්කරුවන් 40ට වැඩි වන විට ගුරු භවතුන් දෙදෙනක් ද යොදගත යුතුය. එක් ගුරු භවතෙකු සඳහා රු.1000/-ක දීමනාවක් හිමි වේ.

09. ඔබට තව දුරටත් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වෙතොත් පහත සඳහන් ලිපිනයෙන් හෝ දුරකථන අංක මගින් විමසන්න.


විභාග කොමසාරිස්<br>
පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව<br>
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව<br>
පැලවත්ත, බත්තරමුල්ල

| | |
|---|---|
| දුරකථන අංක | : **0112784537 / 0112784208 / 0112786616 / 0112785922 / 0112785413** |
| ක්ෂණික දුරකථන අංකය | : **1911** |
| විද්‍යුත් ලිපිනය | : gr5schexam@gmail.com |
| ෆැක්ස් අංකය | : **0112784422** |

එච්.ජේ.එම්.සී.අමිත් ජයසුන්දර<br>
විභාග කොමසාරිස් ජනරාල්


D:\Grade 5 2024\Principal Instruction for Exam & admition.docx